# සංක්ෂිප්තය

අ.පො.ස.(සා.පෙළ) සඳහා පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි වෘත්තිය මාර්ගෝපදේශ කාර්ය භාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය ඔස්සේ සිදු කෙරිණි. සමීක්ෂණ පර්යේෂණ පිරි සැලසුමට අනුව පර්යේෂණය සිදු කෙරිණි. 11 ශ්‍රේණියේ සිසුන්ගේ වෘත්තිය වරණයන්ගේ ස්වභාවය හඳුනා ගැනීම, පාසල් වෘත්තිය මාර්ගෝපදේශ ක්‍රියාකාරකම්වල පවත්නා තත්වය සොයා බැලීම, පාසල තුළ වෘත්තිය මාර්ගොපදේශ සේවාවක් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට පවත්නා බාධක හා ගැටලු හඳුනා ගැනීම, පාසල් වෘත්තිය මාර්ගෝපදේශ ක්‍රියාවලිය පිළිබඳ ගුරු සිසු සංජානනය හඳුනා ගැනීම සහ පාසල මගින් ක්‍රියාත්මක කළ හැකි වෘත්තිය මාර්ගෝපදේශ ක්‍රියාකාරකම් යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ මෙම අධ්‍යනය මෙහෙයවනු ලැබීය. නියැදිය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ පාසල් පහක 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 160 දෙනෙකු සහේතුක නියැදිකරණය යටතේ තෝරා ගන්නා ලදි. එසේ ම වෘත්තිය මාර්ගෝපදේශය ක්‍රියාත්මක වන පාසල් පහක විදුහල්පතිවරුන් පස් දෙනෙකු හා ගුරුවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ සමස්ත නියැදියේ සංඛ්‍යාව 170 කි. ප්‍රශ්නාවලි භාවිතයෙන් සිසුන්ගෙන් ද විදුහල්පතිවරු හා ගුරුවරුන්ගෙන්ගෙන් ද සම්මුඛ සාකච්ඡා භාවිතයෙන් දත්ත රැස් කර ගන්නා ලදි. ලබා ගත් දත්ත ගුණාත්මකව මෙන්ම ප්‍රතිශත, වගු, ප්‍රස්තාර ඇසුරින් ප්‍රමාණාත්මකව ද අරමුණුවලට අදාළව විශ්ලේෂණය කර ඉදිරිපත් කරන ලදි. දත්ත විශ්ලේෂණයෙන් ලබා ගත් ප්‍රතිඵල අනුව පහත සඳහන් නිගමනයන්ට එළඹිණි. අවශ්‍යතාවයට අනුව වෘත්තිය මාර්ගෝපදේශය සඳහා වෙනම ගුරුවරුන් බඳවා ගත යුතු බව, වෘත්තිය මාර්ගෝපදේශය සඳහා අදාළ ගොඩනැගිලි පහසුකම් හා භෞතික පහසුකම් නොමැති බව, නිශ්චිත කාලයක් වෘත්තිය මාර්ගෝපදේශය සඳහා යොදා නොගන්නා බව හා මෘදු කුසලතා සංවර්ධනය නොවන බව නිගමනය කරන ලදි. තවද වෘත්තිය මාර්ගෝපදේශ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීම කළ යුතු බව, අදාළ කාමර පහසුකම් හා භෞතික පහසුකම් ලබා දිය යුතු බව, වෘත්තිය මාර්ගෝපදේශය සඳහා නිශ්චිත කාලයක් යෙදවිය යුතු බව හා මෘදු කුසලතා සංවර්ධනය විය යුතු බව පර්යේෂණ යෝජනා ලෙස ඉදිරිපත් වී ඇත.

# Abstract

The survey deals with the role of career guidance in schools ,at the G.C.E O/L's stage. The research was done according to the survey method, considering five objectives which are examining the nature of the choice of careers, identifying the practical problems related to the functioning of career guidance effectively in schools, identifying the perception of the teachers and students related to career guidance, and making new suggestions for career guidance programs. 160 pupils studying in five schools in the Jayawardanapura zone of education in Colombo district were selected for the survey, consisting eighty female students and eighty male students. The sample further consisted of five principals and five teachers from schools where career guidance programs were carried out. The whole survey consisted of hundred and seventy participants. The data was collected using questionnaires and interviews. Further, the data was analyzed quantitively and qualitatively using tables, graphs, and percentages according to the objectives of this research. The following conclusions were made as a result of the analyzed data. There is a lack of development of skills by the career guidance programs and there is a shortage of teachers to provide career guidance education. According to the conclusions, the following suggestions were made. Formalizing the career guidance process, recruiting teachers for the subject separately and training them, devoting a particular period of time for the subject, and developing soft skills by successful implementation of an effective career guidance process.